# ජාතිවාදයෙන් මෝහනය වී සමාජ අරගලය යට දැමූ යුගයේ අවසානය

ජාතිවාදී උද්ඝෝෂණයෙන් ඉහළම තැනට ගිහින් ජනාධිපතියෙකු පත්කරගත් බලසම්පන්න විමල් හා ජනතා විමුක්ති පෙරමුණ විරසක වීම හුඟ දෙනෙකුට අදහා ගන්නවත් බැරි දෙයක් බවට පත්වෙලා.

ඒ ගැන කියන කථා ඇහැව්වහම මොන තරම් අවුලක් මේ සමාජය තුළම තිබෙනවද කියල පේනවා. හුඟ දෙනෙක් විශ්වාස කළේ මහිනදගේ බලය සමඟ විමල් දීප්තිමත් තාරකාවක් වගේ දිලිසී දිලිසී සිටීවි කියලයි.

ඒත් එහෙම වුණේ නැතිව ජනතා විමුක්ති පෙරමුණම විමල්ගේ ලයින් එක පිළිගෙන නෑ. මෙයට හේතුව සමාජය තුළ ඇති කැකෑරෙන සටන් තත්වයයි.

විමල්ගේ ජාතිවාදී ඇවිස්සීම් තුළ ජනතාව හිරවෙලා හිටියත් දැන් ඇති උග්‍ර ආර්ථික ප්‍රශ්න උඩ ජනතාව වෙනත් දෙසකට යොමුවෙන්නට පටන් අරන්.

යුද්ධය ගැන තිබුණ විශ්වාසය බිඳ වැටෙන්නට පටන් අරන්. මේ බලපෑම ජනතා විමුක්ති පෙරමුණ තුළටත් කාවදින්නට පටන් අරන්. ඒ පක්ෂය තවමත් පීඩිත ජනතාව තුළ පහළ මට්ටමින් ක්‍රියාත්මක වන බව මෙයින් පෙනෙනවා.

විශේෂයෙන්ම නිර්ධන පංතිය තුළ වැඩ කරන ලාල් කාන්ත මහත්තයට වැඩපල තුළ ඌෂ්ණය වැදිල තියෙනව. ඒ නිසා මේ පහළ පීඩිත හඬ පක්ෂය තුළට ඇතුළුවීමත් සමඟ විමල්ගේ ජාතිවාදී දේශහිතෛෂී බලවේගවලට විට් එක දෙන්න වෙලා.

වැඩකරන ජනතාව ජාතිවාදය තුළ හිර කරගෙන සිටීමට වැඩියෙන්ම ක්‍රියා කළේ විමල් වීරවංශයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ එයට මැදිහත් වුණේ ශ්‍රීපති සූරියආරච්චි, ජෙයරාජ්පුල්ලේ වගේ ඇමතිවරුනුයි. ඒ අයගේ අභාවයත් මේකට බලපාල තියෙනව.

මේ අනුව මහින්ද රජයට සම්බන්ධ වැඩකරන ජනතාවගේ සංවිධාන රාමුවලත් පිපිරීම් ඇති වෙන්නට මේ කාල වකවානුවේදී ඉඩ තියෙනව. සමහර විට ජනතා විමුක්ති පෙරමුණේ අළුත් ක්‍රියාමාර්ගයන් අනුව කටයුතු කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිත් එකතු වෙන්න පුළුවන්.

කොහොම වුණත් මේ බෙදීම් නිසා ජාතිවාදී බලඇණියට පාඩුවක් සිදු වෙනව. විශේෂයෙන්ම වැඩ කරන ජනතාව මත පණවපු කොන්ට්‍රෝල් එක බිඳ වැටෙනව. ඉදිරියේදී සටන් ඇති වීමට ඉඩකඩ වැඩි වේවි. ආණ්ඩුව බොහොම කලබලයෙන් හදිසි නීති දමල හාල් මිල බස්සන්න උත්සාහ ගත්තේ නාගරික පෙදෙස්වල ජනතාව ලොකු කළබැගෑනියක් කරයි කියල බයෙන්.

දැන් කොළඹ වෙළඳ සංගම් කියල තියෙන්නේ ලාබෙට හාල් මෝල්වලින් ලැබෙනව නම් අනිවාර්යයෙන්ම අඩුවෙන් දෙන්න පුළුවන් නැත්නම් බෑ. කඩ වහල ඉන්න තමයි එහෙනම් වෙන්නේ කියලයි.

ආණ්ඩුව හමුදාවත් දාගෙන හාල් මිල පාලනය කරන්නට ලොකු දඟලිල්ලක් කරන්නේ "හාල් මිල අඩු කරව්" කියන පෙළපාලි එන එක නවත්වා ගැනීම පිණිස බවට පැහැදිලි තොරතුරු දැන් ඇවිත් තියෙනව.

මේ අනුව ආණ්ඩුව දැන් යුද්ධ දෙකකට පැටලැවිලා. එක අතකින් දෙමළ ජනතාව යටත් කර ගැනීමට කරන යුද්ධය. අනෙක් අතට බඩගින්න කොන්ට්‍රෝල් කරගැනීමට කරන යුද්ධය. මේ විදියට යුද්ධ දෙකක් මාර්ෂල් ලෝ මගින් ගෙනියන තැනට

ආණ්ඩුව වැටිලා.

මේ අතර විදුලි බලය කඩාකප්පල් කිරීමේ වැඩපිළිවෙලක් දියත් වෙලා කියල පොලීසිය කියනව. දැන් පෙදෙස් කිහිපයකම ට්‍රාන්ස්ෆෝමර්වලට බෝම්බ දමල හානි කරල තියෙනව.

මේවා සිදුවෙලා තියෙන්නේ සිංහල අය වැඩියෙන් ඉන්න පෙදෙස්වල වීම ආණ්ඩුවට ලොකු ප්‍රශ්නයක්. කඩාකප්පල්කාරී සටනක් යම් සංවිධාන මට්ටමකින් දියත් වලාද? යන ප්‍රශ්නයට දැන් පොලීසිය යොමු වෙලා සිටින්නේ.

බෝම්බ පිපිරීම් පමණක් නෙවෙයි, මේ වගේ තැන් තැන්වල සිදු වන ගිනි තැබීම් ගැනත් අවධානය යොමු වෙලා තියෙනව. ඒවත් සංවිධානාත්මකද යන ප්‍රශ්නයට මුහුණ දෙන්නට සිදු වෙලා.

මේ අනුව ජනතා විමුක්ති පෙරමුණ අළුත් මහක් අරන් ද කියලත් සමහරු ප්‍රශ්න කරනව. මට නම් හිතෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ දැන් යොමු වෙන්නේ වැඩවර්ජන හා අනෙකුත් බහුජන සටන් තුළ ක්‍රියාත්මක වීමටයි.

ඒවා බිඳ වැටුනෙත් නැත්නම් වැඩවර්ජන පුළුල් ක්‍රියාමාර්ගයක් වුණේ නැත්නම්, වෙනස් සටන් ක්‍රියාමාර්ගවලට සමහරු යොමු වෙන්නට පුළුවන්.

දැන් ආණ්ඩුව හදන්නේ ඇති වන ප්‍රචණ්ඩ ක්‍රියා හැම එකක්ම ජනතා විමුක්ති පෙරමුණේ කරේ එල්ලන්නටයි. විමල් වීරවංශලා උඩගෙඩි දෙන්නේ මේ සෙල්ලම ඉදිරියට ගෙන යාමටයි.

ඔවුන් දැන් අනියම් ලෙස කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ ත්‍රස්ත ක්‍රියා දෙසට දැන් යොමු වීමට ඉඩ ඇති බවයි. මෙයින් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ සමාජ අරගලය දෙසට ඇදෙන රැඩිකල් තරුණයන් බියවැද්දීමයි.

පාර්ලිමේන්තුවේ විමල් හලපු කඳුළුත් සමඟ මේ සමාජය තුළ ජාතිවාදය ගහපු උඩු කරණම් අවසානයකට ගෙනියනවා. පීඩිත ජනතාව ජාතිවාදයෙන් මෝහණය වී සමාජ අරගලය යට දමපු යුගය අවසන් වෙනවා.

දැන් ජාතිවාදයට ඇත්තේ පෙරළිකාරී ගමනක් නෙවෙයි, අගතිගාමී මර්ධනකාරී ගමනක්. එයට සටන්කාමීන්ගෙන් ඇති වැඩක් නෑ. සටන්කාමීන්ට ඇත්තේ දැන් පංති අරගලය දෙසට යොමුවීමටයි.

උතුරේ දෙමළ අරගලයත් තවම යටවෙලා නෑ. තුන් පැත්තකින් පහර වදිද්දීත් යට නොවී සිටීම තුළින් පෙන්වන්නේ දෙමළ ජනතාවගේ නිදහසට ඇති උවමනාවයි. මේ උවමනාව දකුණේ සටන් හා අරගල සමඟ අත්වැල් බැඳගැනීම දෙසටයි සිදධීන් පෙරළී යන්නේ.

මේ අත්වැල් බැඳගැනීම වෙනුවෙන් පෙනී සිටින මැයි පෙළපාලිය ගාලු පාරේ කෘෂි ශාලාව ළඟින් පිටත් වෙලා හයිඩ් පිටියේ රැළියක් පවත්වන බව ආරංචියි.